තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතිය - 2013

---------------------------------------------------------

තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතියේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය (ශ්‍රී.ලං.ර.) සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං.) අතර 2010 නොවැම්බර් 08 දින එලඹි අංක 4702 එල්කේ දරන මූල්‍යයන ගිවිසුමේ 11 ආ (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු ,අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---------------------------------------------------------------------------------

තිරසාර සංචාරක සංවර්ධන ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුම ප්‍රකාරව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය (ආ.සං.අ) සහ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය (ශ්‍රී ලං.සං.සං.අ) පිළිවෙලින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ සහ ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතන වේ. ප්‍රතිග්‍රාහකගේ සංචාරක අංශය සඳහා පාරිසරික හා සාමාජීය සාධාරණ ආයෝජන පහසුකම් සැලසීම, විශේෂයෙන් නැගෙනහිර පළාත තුළ සිදු කිරීම සඳහා අවශ්‍ය ආයතනික රාමුව ශක්තිමත් කිරීම මෙම ව්‍යාපෘතියේ අරමුණ වේ. මූල්‍ය ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත මුළු පිරිවැය විශේෂ හැර ගැණුම් හිමිකම් (SDR) 11,600,000 (එක්සත් ජනපද ඩොලර් මිලියන18) ක් වන අතර මෙම මුළු මුදලම ජාත්‍යන්තර සංවර්ධන සංගමය (ජා.සං.සං) විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2011 මැයි 16 දින ආරම්භ කරන ලද අතර 2014 දෙසැම්බර් 31 වන විට නිම කිරීමට නියමිතය. කෙසේ වුවද, භාණ්ඩාගාර ලේකම් විසින් ගනු ලැබූ තීරණයක් අනුව ව්‍යාපෘතියේ කටයුතු 2013 ඔක්තෝබර් 14 දින නවතා තිබුණි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

--------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම කළමනාකරණයේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක

කිරීම සහ පවත්වාගෙන යාමත්, යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ යොදා ගැනීමත්, අවස්ථාචෝචිතව සාධාරණ ලෙස ගිණුම්කරණ ඇස්තමේන්තු සකස් කිරීමත් මෙම වගකීමට ඇතුළත් වේ.

2. විගණන විෂය පථය සහ මතය සඳහා පදනම

-------------------------------------------------

මාගේ විගණන පරීක්ෂණ මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මෙම වාර්තාවේ ඇතුළත් විගණන මතය, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාරී වන සාක්ෂි නියැදි පදනම මත පරීක්ෂා කිරීම්, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති හා වැදගත් ඇස්තමේන්තු සහ මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ උපරිම දැනීම හා විශ්වාසය පරිදි විගණන කටයුතු සඳහා අවශ්‍ය වන ප්‍රමාණවත් තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලදී. ඒ අනුව මාගේ මතය සඳහා ප්‍රමාණවත් පදනමක් මාගේ විගණනය මඟින් සපයන බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීම පිණිස අවශ්‍ය යැයි සලකනු ලැබූ පද්ධති හා පාලන, ගනුදෙනු, වත්කම්, වගකීම් හා ගිණුම් වාර්තා පිළිබඳ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියෙහි විශ්වාසවන්තභාවය තහවුරු කිරීම පිණිස පද්ධති හා පාලන ප්‍රමාණවත් වූයේද යන බව,

(ආ) ශ්‍රී ලංකා රජයෙන් සහ ණය සපයනු ලබන නියෝජිතායතනයෙන් ලද අරමුදල්වලින් ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම, මූල්‍ය සහ භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය,

ව්‍යාපෘතියේ මෙහෙයුම්වලින් උද්ගත වූ වත්කම් හා වගකීම් , ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනා ගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වා ගනු ලැබුවේද යන බව,

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව,

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය සහ උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව,

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගන්නා ලද වර්ගීකරණයට අනුව, වියදම් නිවැරදි ලෙස හඳුනාගෙන තිබුණේද යන බව,

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව,

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව,

3. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව සහ මෙම වාර්තාවේ 5 ඡේදයේ දැක්වෙන කරුණු වලින් උද්ගත වන ගැලපීම්වලින් ඇතිවන බලපෑම් හැරුණු විට මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව, සහ 2013 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඇ) මූල්‍ය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවී තිබුණු බවත්ය.

4. මූල්‍ය ප්‍රකාශන

-----------------

4.1 මූල්‍ය කාර්ය සාධනය

----------------------

මූල්‍ය ප්‍රකාශන හා ලබාගත හැකිවූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘතියේ වියදම රු. 10,041,213 ක් වූ අතර 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.13,730,630 ක් විය. සංරචක වශයෙන් සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම්, ඉකුත් වර්ෂය සඳහා වියදම සහ 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වියදම් වර්ගය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2013 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2013 | 2012 | |
| | රු. | රු. | රු. |
| දේපල, පිරියත හා උපකරණ (ශුද්ධ පොත් අගය) | 2,857 | - | 101,323 |
| උපදේශන ගාස්තු | - | 300,000 | 1,711,850 |
| ප්‍රචාරණ සහ ප්‍රකාශනයන් | 1,896,803 | - | 2,415,446 |
| පරිපාලන වියදම් | 7,636,638 | 81,595 | 8,585,221 |
| වෙනත් ව්‍යාපෘති වියදම් | 503,915 | - | 912,779 |
| මූල්‍ය පිරිවැය | 1,000 | - | 4,011 |
| | 10,041,213 | 381,595 | 13,730,630 |

4.2 විශේෂ (ඩොලර්) ගිණුම

---------------------------

ව්‍යාපෘතිය ආරම්භයේ සිටම විශේෂ ( ඩොලර්) ගිණුමක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

5. විගණන නිරීක්ෂණ

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ අරමුණු ඉටුකර ගැනීම තහවුරු වන පරිදි ව්‍යාපෘතිය ආරම්භයේ සිට පසුව ව්‍යාපෘතියේ විෂය පථය සංශෝධනය දක්වා විස්තීර්ණ විස්තරාත්මක ක්‍රියාකාරි සැලැස්මක් සකස් කල යුතු වුවද එබඳු සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) ව්‍යාපෘතිය ආරම්භයේදීම එහි අරමුණු පැහැදිලිව නිර්වචනය කර 2013 පෙබරවාරි 05 දින ව්‍යාපෘතියේ විෂය පථය සංශෝධනය කර තිබුණු නමුත් ව්‍යාපෘතියේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රචාරණය සහ පරිපාලන කාර්යයන් වැනි මූලික කටයුතු වෙනුවෙන් එකතුව රු. 13,730,630 ක වියදමක් දරා තිබියදී ව්‍යාපෘතියේ අරමුණු ඉටු කිරීමට කිසිදු විකල්ප ක්‍රියාමාර්ගයක් නොගෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ ඉල්ලීම පරිදි ව්‍යාපෘතිය අවසන් කර තිබුණි. එබැවින් ඉහත ක්‍රියාකාරකම් සඳහා දරන ලද පිරිවැය නිෂ්ඵල වී තිබුණු බව දක්නට ලැබුණි. තවද ව්‍යාපෘතිය අවසන් කිරීම සඳහා වූ අමාත්‍ය මණ්ඩල අනුමැතිය විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) මූල්‍ය ගිවිසුමේ 2.03 සහ 2.04 වගන්ති අනුව අරමුදල උපයෝජනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු සේවා හා බැඳීම් ගාස්තු සහ ගෙවිය යුතු පොළී, නිශ්චය කොට ගිණුම්වලට ගෙන නොතිබුණි.

6. මූල්‍ය සහ මෙහෙයුම් සමාලෝචනය

------------------------------------------

6.1 අරමුදල් උපයෝජනය

--------------------------

සමාලෝචිත වර්ෂයේ සහ 2013 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනයේ තත්ත්වය පහත දැක්වේ.

| ප්‍රභවය | මූල්‍ය ගිවිසුම අනුව අරමුදල් වෙන් කිරීම | | වාර්ෂික ඇස්තමේන්තුව අනුව සමාලෝචිත වර්ෂය සඳහා කරන ලද වෙන්කිරීම | 2013 දෙසැම්බර් 31 දින දක්වා උපයෝජනය කරන ලද අරමුදල් | |
|---|---|---|---|---|---|
| | එ.ජ.ඩො. | රු. | රු. | එ.ජ.ඩො. | රු. |
| ජා.සං.සං. | 18,000,000 | - | 700,000,000 | 114,417 | 13,563,370 |
| ශ්‍රී ලං. ර | - | - | - | 1,499 | 164,500 |
| | 18,000,000 | - | 700,000,000 | 115,916 | 13,727,870* |

* උපචිත වියදම්වල බලපෑම හේතු කොටගෙන මෙම සංඛ්‍යාවන් ඡේද 4.1 හි දැක්වෙන සංඛ්‍යාවන්ගෙන් වෙනස් වේ.